# ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ගැසට් පත්‍රය

## අති විශේෂ

**අංක 2405/13 – 2024 ඔක්තෝබර් මස 08 වැනි අඟහරුවාද – 2024.10.08**

(රජයේ බලයපිට ප්‍රසිද්ධ කරන ලදී)


# I වැනි කොටස: (I) වැනි ඡේදය – සාමාන්‍ය

## රජයේ නිවේදන

මගේ අංකය: IR/COM/02/2021/166

**කාර්මික ආරාවුල් පනත - 131 වන අධිකාරය**

අංක 2394/34 දරන හා 2024.07.23 දිනැති ශ්‍රී ලංකා ප්‍රජාතන්ත්‍රික සමාජවාදී ජනරජයේ *අති විශේෂ ගැසට් පත්‍රයේ* ප්‍රසිද්ධියට පත් කරනු ලැබූ එක් පාර්ශ්වයක් වශයෙන් ලබ්බල, කු/ලබ්බල, කන්දෙවත්ත, අංක 425 හි පදිංචි එච්.එම්.එන්.ජී.එම්.පී.හේරත් මිය ඇතුළු සේවකයින් දසදෙනා සහ පැලියගොඩ, මීගමුව පාර, තේමා උද්‍යාන ගොඩනැගිල්ල (වර්තමාන ලිපිනය:- කොළඹ 02 , ඩබ්.ඒ.ඩී.රාමනායක මාවත, අංක 130) හී පිහිටි ජාතික යන්ත්‍රෝපකරණ ආයතනය ( ශ්‍රී ලංකා රාජ්‍ය ඉංජිනේරු සංස්ථාවට අනුබද්ධිත ආයතනයකි) අතර පැවති කාර්මික ආරාවුල සම්බන්ධයෙන් බේරුම්කරු විසින් ලබා දී ඇති අංක A 66/2023 දරන හා 2024.05.17 දිනැති ප්‍රදානය ප්‍රතික්ෂේප කරන බව දන්වමින් ජාතික යන්ත්‍රෝපකරණ ආයතනය වෙතින් කාර්මික ආරාවුල් පනතේ 20(1) යටතේ නිවේදනයක් මා වෙත ලැබී ඇත.

එහෙයින් අංක A 66/2023 දරන බේරුම්කාර ප්‍රදානය ක්‍රියාත්මක වීම 2025.07.22 දින සිට අවසන් වන බවට පනතේ 20(2) (ආ) වගන්තිය යටතේ මෙයින් ප්‍රකාශයට පත් කරනු ලැබේ.

**එච්. කේ. කේ. ඒ. ජයසුන්දර,**
කම්කරු කොමසාරිස් ජනරාල්.

2024 සැප්තැම්බර් මස 19 වැනි දින,
කම්කරු දෙපාර්තමේන්තුව,

1A – G 42851 – 11 (2024/10)
*මෙම අති විශේෂ ගැසට් පත්‍රය* www.documents.gov.lk *වෙබ් අඩවියෙන් බාගත කළ හැක.*

කොළඹ 05.

පළමුවන උපලේඛනය

''අ'' ආකෘති පත්‍රය

(3 වන නියෝගය)

*1950 අංක 43 දරන කාර්මික ආරාවුල් පනත*

**බේරුම්කරුවකුගේ තීරණයක් ප්‍රතික්ෂේප කිරීමේ දැන්වීම**

ලිපිනය : ජාතික යන්ත්‍රෝපකරණ ආයතනය (ශ්‍රී ලංකා රාජ්‍ය ඉංජිනේරු සංස්ථාවට අනුබද්ධිත ආයතනයකි) තේමා උද්‍යාන ගොඩනැගිල්ල, පැලියගොඩ

නව ලිපිනය : අංක 130, ඩබ්ලිව්.ඒ.ඩී.රාමනායක මාවත, කොළඹ 02

දිනය : 2024.09.06

කම්කරු කොමසාරිස් ජනරාල් වෙතටය,

23.07.2024 දිනැති අංක 2394/ 34 දරන *ගැසට් පත්‍රයේ* පළකරන ලද්දාවූ ද ජාතික යන්ත්‍රෝපකරණ ආයතනය (ශ්‍රී ලංකා රාජ්‍ය ඉංජිනේරු සංස්ථාවට අනුබද්ධිත ආයතනයකි ) සහ එච්.එම්.එන්.ජී.එන්.පී.හේරත් මිය ඇතුලු සේවකයින් දස දෙනෙකු බැඳි සිටින්නා වූද 2024.05.17 දින දරන බේරුම්කරුගේ තීරණය ප්‍රතික්ෂේප කරන බව මෙයින් දැනුම් දෙනු ලැබේ.

රත්නසිරි කළුපහන,
සභාපති,
ශ්‍රී ලංකා රාජ්‍ය ඉංජිනේරු සංස්ථාව.

*පිටපත :*

1. එච්.එම්.එන්.ජී.එම්.පී.හේරත් මිය
2. ඩබ්ලිව්.එම්.පුෂ්පා කුමාරි වනිගසේකර මිය
3. ඩබ්ලිව්.ජේ.ඒ.පී.උදේශිකා මිය
4. ඒ.එම්.සුගත් බණ්ඩාර මයා
5. ඒ.එච්.සඳනිකා මිය
6. ඩබ්ලිව්.පී.ඒ.මධුමාල් මයා
7. එම්.ඩී.අජිත් පුෂ්පකුමාර මයා
8. බී.පී.රුවන් මයා
9. බී.පී.ඩී.කුමාර මයා
10. ජේ.එම්.නාලක ජයසිංහ මයා
    නො.425 , කන්දෙවත්ත, කු/ලබ්බල, ලබ්බල

1) ප්‍රතික්ෂේප කරන පාර්ශ්වය, වෘත්තීය සමිතිය, සේවායෝජකයා හෝ සේවකයා විසින් අවස්ථාවෝචිත පරිදි තීරණයෙන් බැඳී සිටින අනෙකුත් සෑම පාර්ශ්වයකටම, වෘත්තීය සමිතියකට, සේවායෝජකයෙකුට සහ සේවකයෙකුට වෙන වෙනම දැන්වීම් යැවිය යුතුය. (පනතේ 9(1), 15(1) හා 20(1) වන වගන්ති බලන්න)

2) දැන්වීම අත්සන් කරන තැනැත්තා එය අත්සන් කරන්නේ වෙනත් යම් පාර්ශ්වයක්, සේවායෝජකයකු, වෘත්තීය සමිතියක් හෝ සේවකයෙකු වෙනුවෙන් නම් ඒ තැනැත්තා එය අත්සන් කරන්නේ කවර පාර්ශ්වයක්, සේවායෝජකයකු, වෘත්තීය සමිතියක් හෝ සේවකයෙකු වෙනුවෙන් ද යන වග ද වෘත්තීය සමිතියක් සම්බන්ධයෙන් වන විට ඔහු ඒ වෘත්තීය සමිතියේ දරන තනතුර ද නිශ්චිතව සඳහන් කළ යුතුය.

EOG 10 – 0084

ශ්‍රී ලංකා රජයේ මුද්‍රණ දෙපාර්තමේන්තුවේ මුද්‍රණය කරන ලදී.